# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1269 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 08/10/2023<br>පැය 0530 |

# මාධ්‍ය නිවේදනය

## 01. ද්විත්ව මනුෂ්‍ය ඝාතනයක් - ඇහැලියගොඩ පොලිස් වසම.

2023.10.07 වන දින උදෑසන කාලයේ ඇහැලියගොඩ පොලිස් වසමේ කැන්දගමුව ප්‍රදේශයේ කාන්තාවක් හා පිරිමි පුද්ගලයෙකු වැටී සිටින බවත්, ඉන් පිරිමි පුද්ගලයා මියගොස් ඇති බවට හා කාන්තාව රෝහල් ගත කිරීමෙන් පසු මියගොස් ඇති බවට ඇහැලියගොඩ පොලීසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 73 ක් හා මරණකාරිය වයස අවුරුදු 57 ක් වන ඇහැලියගොඩ ප්‍රදේශයේ පදිංචි සහෝදර සහෝදරියන් වේ.**

මරණකරුගේ පුතා විසින් ආරවුලක් හේතුවෙන් අතින් පයින් පහරදී මෙම ද්විත්ව මනුෂ්‍ය ඝාතනය සිදුකර ඇති අතර සැකකරු යම් මානසික රෝගයකින් පෙලෙන බවට දැනට සිදුකල විමර්ශන වලදී අනාවරණය වී ඇත. වයස අවුරුදු 30 ක් වූ සැකකරු අත්අඩංගුවට ගෙන ඇහැලියගොඩ මූලික රෝහලේ අධිකරණය වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව බන්ධනාගාරය මගින් මානසික වෛද්‍යවරයෙකු වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දී ඇත.

මෘත ශරීර ඇහැලියගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. ඇහැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 02. මනුෂ්‍ය ඝාතනයක් - තඹුත්තේගම පොලිස් වසම.

2023.10.07 වන දින සවස් කාලයේ තඹුත්තේගම පොලිස් වසමේ නවසිරිගම ප්‍රදේශයේ පිහියකින් ඇන මනුෂ්‍ය ඝාතනයක් සිදුකර ඇති බවට තඹුත්තේගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 51 ක් වන නවසිරිගම, රාජාංගනය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරියගේ සැමියා වසර 15 කට පමණ පෙර මියගොස් සිට ඇති අතර, ඉන් පසු ඇය සැකකරු සමඟ එකට ජීවත් වෙමින් සිට ඇත. මරණකාරිය නිවසේ ඉදිරි පස දොර අසල සිටින අවස්ථාවේ සැකකරු නිවසට පැමිණ ඉනෙහි සඟවා තිබූ පිහියක්

ගෙන පසු ප්‍රදේශයට පහරදී ඇති අතර තුවාලකාරිය 05 කණුව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් සිටින බවට වෛද්‍යවරුන් ප්‍රකාශ කර ඇත.

සැකකරු වයස අවුරුදු 64 ක් වූ එම ප්‍රදේශයේම පදිංචිකරුවෙකු වන අතර, අපරාධයෙන් පසු ප්‍රදේශයෙන් පලාගොස් ඇත. සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා තඹුත්තේගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 03. මනුෂ්‍ය ඝාතනයක් - තණමල්විල පොලිස් වසම.

2023.10.07 වන දින සවස් කාලයේ තණමල්විල පොලිස් වසමේ තණමල්විල නගරයේ පැරණි සුරාසැල පිහිටි ගොඩනැගිල්ල පිටුපස පහරදීමක් හේතුවෙන් තුවාල සහිතව වැටී සිටි පුද්ගලයෙකු තණමල්විල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 47 ක් පමණ වූ ගාමිණිපුර, තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තවත් තිදෙනෙකු සමඟ මත්පැන් පානය කරමින් සිටියදී ඇතිවූ ආරවුලක් හේතුවෙන් මරණකරු විසින් එම ස්ථානයේ සිටි අයෙකුට බෝතලයකින් පහරදීමක් සිදුකර ඇති බවත් අනතුරුව සැකකරු එම ස්ථානයේ තිබූ තවත් වීදුරු බෝතලයක් ගෙන මරණකරුගේ හිසට පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවටත් විමර්ශනයේදී අනාවරණය වී ඇත.

අපරාධය සම්බන්ධයෙන් තණමල්විල ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 23 ක් වූ සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. මෘත ශරීරය තණමල්විල රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 04. අපරාධ ගණනාවකට අවශ්‍ය කරන සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2023.10.07 වන දින දහවල් කාලයේ පෑලියගොඩ ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ව්‍යාජ ලියා පදිංචි සහතික ඇතුළු ලේඛණ ඉදිරිපත්කර මෝටර් රථයක් විකුණා මුදල් රුපියල් 3,975,000/- වංචා කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 51 ක් වූ පහලගම, පොල්ගස්ඕවිට ප්‍රදේශයේ පදිංචි වාහන හා ඉඩම් වෙළඳාම් කරන පුද්ගලයෙකි.**

**සැකකරු සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී පහත තොරතුරු අනාවරණය වී ඇත.**

- සැකකරු අන් අයෙකු ලෙස පෙනී සිටිමින් මුදල් රුපියල් 23,750,00/- ක් වංචා කිරීම සම්බන්ධයෙන් ගාල්ල ගරු ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ වසර 02 ක බරපතල වැඩ සහිත සිර දඬුවමක්ද, පැමිණිලිකරුට රුපියල් ලක්ෂ 10 ක වන්දියක් ද ගෙවීමට නියම කර විවෘත වරෙන්තු නිකුත් කර ඇත. තවද රුපියල් ලක්ෂ 80 ක් වටිනා මෝටර් රථයක් ලබාගෙන වංචා කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් සැකකරුවෙකු ලෙසද එම අධිකරණය මගින්ම මොහුට විවෘත වරෙන්තු නිකුත් කර ඇත.

- තංගල්ල විශේෂ අපරාධ විමර්ශන අංශය මගින් සිදුකරන ලද කූට ලේඛණ සකස් කර මෝටර් රථ උකස් කර වංචා කිරීමේ සිද්ධීන් 02 ක් සම්බන්ධයෙන් හම්බන්තොට ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩු 02 ක් සඳහා අවශ්‍ය කරන සැකකරුවෙකි.

- හෝමාගම විශේෂ අපරාධ අංශය මගින් විමර්ශනය කරන ව්‍යාජ විකිණීමේ ඔප්පුවක් පෙන්වා මෝටර් රථයක් මුදල් රුපියල් ලක්ෂ 14 කට විකුණා වංචා කිරීමක් සම්බන්ධයෙන් හෝමාගම ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩුවක සැකකරුවෙකි.

- කොළඹ වංචා විමර්ශන කාර්යාංශය මගින් සිදුකරනු ලබන විමර්ශන වලට අදාලව වෑන් රථයක අයිතිය ව්‍යාජ ලේඛණ ඉදිරිපත්කර වංචා කිරීම සම්බන්ධයෙන් හා මෝටර් රථයක් කුලී පදනම මත ලබාගෙන නැවත ලබා නොදී සාපරාධී විශ්වාසය කඩ කිරීම යන අපරාධ 02 ක් සඳහා කොළඹ ගරු ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩු 02 ක සැකකරුවෙකි.

සැකකරු සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 05. අපරාධ වලට සම්බන්ධ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ දිසා අපරාධ කොට්ඨාසය.

2023.10.07 වන දින දහවල් කාලයේ රාජගිරිය, පොල්වත්ත ප්‍රදේශයේදී බස්නාහිර පළාත් දකුණ දිසා අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත බොරැල්ල හා වැලිකඩ පොලිස් ස්ථාන වෙත වාර්තා වී තිබූ අපරාධ කිහිපයකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වූ රාජගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**සැකකරු සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී පහත තොරතුරු අනාවරණය වී ඇත.**

- බොරැල්ල පොලිස් ස්ථානයට වාර්තා වී තිබූ රොඩ්නි පාර, ෆීල්ඩ් ගාඩ්න් මාවත, එන්.එම් පෙරේරා මාවත, බෞද්ධාලෝක මාවත, ඇල්විටිගල මාවත හා ඩඩ්ලි සේනානායක මාවත යන ප්‍රදේශ වල විදුලි මණ්ඩලයට අයත් මාර්ගස්ථ විදුලි කුටි 06 ක සවිකර තිබූ රුපියල් 2,678,808/- ක් පමණ වටිනා තඹ වයර් රැහැන් සොරකම් කිරීම.

- වැලිකඩ පොලිස් ස්ථානයට වාර්තා වී තිබූ රාජගිරිය ඔබේසේකරපුර ප්‍රදේශයේ විද්‍යාලයක රුපියල් 240,000/- ක් වටිනා රූපවාහිණී යන්ත්‍ර 04 ක් සොරකම් කිරීම.

2023.10.07 වන දින සවස් කාලයේ බොරැල්ල හා දෙමටගොඩ ප්‍රදේශ වලදී ඉහත වැලිකඩ පොලිස් ස්ථානයට වාර්තා වී තිබූ රූපවාහිණී යන්ත්‍ර 04 ක් සොරකම් කිරීමේ අපරාධයට සම්බන්ධ තවත් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් එම සැකකරුවන් අවුරුදු 35 හා 43 වයස් වල පසුවන බොරැල්ල හා දෙමටගොඩ ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් විසින් සොරා ගන්නා ලද වයර් වලින් ඉවත් කර තිබූ තඹ කම්බි හා ආවරණ කොටස්, බැටරි 02 ක් හා රූපවාහිණී යන්ත්‍ර 04 විමර්ශන නිලධාරීන් විසින් සොයාගෙන ඇත. සැකකරුවන් තිදෙනා හා නඩු භාණ්ඩ වැඩිදුර විමර්ශන සඳහා වැලිකඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත්කර ඇත. වැලිකඩ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. අපරාධ වලට සම්බන්ධ සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට - වත්තල පොලිස් ස්ථානය.

2023.10.07 වන දින දහවල් කාලයේ වත්තල පොලිස් වසමේ ගල්වැටිය ප්‍රදේශයේදී වත්තල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 120 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වූ ගල්වැටිය, වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොහු වත්තල පොලිස් ස්ථානයට වාර්තා වී ඇති යතුරුපැදියකින් පැමිණ මාර්ගයේ ගමන් කරමින් සිටි කාන්තාවන්ගේ රන් මාල කොල්ලකෑමේ අපරාධ 03 ක්, තවත් කාන්තාවකගේ රන් මාලයක් කොල්ලකෑමට තැත් කිරීම හා දේපල සොරා ගැනීම යන අපරාධ වල සැකකරුවෙකු බවට අනාවරණය වී ඇත.

සැකකරු විසින් කොල්ලකන ලද රන් මාල කැබලි කොටස්, ටැබ් යන්ත්‍රයක් හා යතුරුපැදියක් ඇතුළු දේපල සොයාගෙන ඇති අතර වත්තල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 07. සැකකටයුතු මරණයක් - හික්කඩුව පොලිස් වසම.

2023.10.07 වන දින සවස් කාලයේ හික්කඩුව පොලිස් වසමේ කන්දඋඩ පාර, හික්කඩුව ප්‍රදේශයේ නිවසක තනිව පදිංචිව සිටි පුද්ගලයෙකු සැකකටයුතු ලෙස මියගොස් ඇති බවට හික්කඩුව පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 86 ක් වන කන්දඋඩ පාර, හික්කඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරයේ ඇට සැකිලි නිවස අසල පිහිටි කොහිල වගාවක් සහිත වගුරු බිමක තිබී හමුවී ඇති අතර, මහේස්ත්‍රාත් පරීක්ෂණය කිරීමෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කිරීම සඳහා අස්ථි කොටස් කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. හික්කඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 08. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පන්නල පොලිස් ස්ථානය.

2023.10.07 වන දින උදෑසන කාලයේ පන්නල පොලිස් වසමේ තලම්මැහැර ප්‍රදේශයේ නිවසකදී පන්නල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 310 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් කැබ් රථයක් හා ජංගම දුරකථනයක්** ද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 31 ක්වූ පමුණුවත්ත, මීරිගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

සැකකාරිය ඉහත ප්‍රදේශයේ තාවකාලිකව පදිංචිව සිට ඇති අතර, වැටලීම සිදුකරන අවස්ථාවේදී නිවසේ සිටි තවත් පුද්ගලයෙකු පලා ගොස් ඇත. එම සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා පන්නල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 09. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.

2023.10.07 වන දින උදෑසන කාලයේ මොරටුව පොලිස් වසමේ ලුනාව ප්‍රදේශයේදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 450 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 ක් වූ මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 10. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.

2023.10.07 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ ඔඩියන් හංදිය අසලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 900 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වූ දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 11. හදිසි අනතුරකින් පුද්ගලයෙකු මියයාම - මීගමුව පොලිස් වසම.

2023.10.07 වන දින රාත්‍රී කාලයේ මීගමුව පොලිස් වසමේ කට්ටුව ප්‍රදේශයේ පිහිටි අයිස් කර්මාන්ත ශාලාවක ලොරි රථයකට අයිස් පටවමින් තිබියදී ලොරි රථය එක්වරම ඉදිරියට තල්ලුවී යාමෙන් ලොරි රථයේ ඉදිරිපස සිටි එහි රියදුරු ලොරි රථයට හා ඉදිරිපස බිත්තියට සිරවී සිදුවූ අනතුරකින් බරපතල තුවාල ලබා මීගමුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වන වල්පොල, පත්තගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 12. රක්ෂිතයක ඇතිවූ ගින්නක් - නාඋල පොලිස් වසම.

2023.10.07 වන දින සවස් කාලයේ නාඋල පොලිස් වසමේ අරංගල ගල පිටුපස රක්ෂිත ප්‍රදේශයේ ඇතිවූ ගිනි ගැනීමකින් ලඳු කැලෑ ප්‍රදේශයක් විනාශ වී ඇති අතර, නාඋල පොලිස් ස්ථානය ලද තොරතුරක් මත විමර්ශන සිදුකර රක්ෂිතයට ඇතුලු වී ගිනි තැබූ බවට සැකපිට පුද්ගලයින් 05 දෙනෙකු ප්‍රදේශවාසීන්ගේ සහාය ඇතිව පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 17 හා 18 වයස් වල පසුවන මාතලේ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෙම සැකකරුවන්ගේ ජංගම දුරකතන වලින් ලබා ගන්නා ලද ඡායාරූප හා වීඩියෝ පටද කූඩාරම් සකස් කිරීම සඳහා යොදා ගන්නා ලද මෙවලම් ද පොලිස් භාරයට ගෙන ඇත. නාඋල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 13. මාරක රිය අනතුරක් - බිංගිරිය පොලිස් වසම.

2023.10.07 වන දින සවස් කාලයේ බිංගිරිය පොලිස් වසමේ මෙලදෙණිය හන්දිය දෙස සිට තාරණ දෙසට ධාවනය වූ ට්‍රැක්ටර් රථයක රිය සහයක ලෙස කටයුතු කල පුද්ගලයෙකු එම ට්‍රැක්ටර් රථය හා ටේලරය සම්බන්ධ කර ඇති කොටසේ ගමන් කිරීමේදී ඉන් බිමට ඇද වැටී සිදුවූ අනතුරකින් බරපතල තුවාල ලබා බිංගිරිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.
**මරණකරු වයස අවුරුදු 67 ක් වන දිවුල්ගස්අංගය, පඩිවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා කුලියාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. බිංගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 14. මාරක රිය අනතුරක් - මැදවච්චිය පොලිස් වසම.

2023.10.07 වන දින රාත්‍රී කාලයේ මැදවච්චිය පොලිස් වසමේ මහනුවර යාපනය මාර්ගයේ කිලෝ මීටර් 151 ත් 152 ත් අතර ප්‍රදේශයේදී සිදුවූ රිය අනතුරකින් පුද්ගලයෙකු මියගොස් ඇති බවට මැදවච්චිය පොලිස් ස්ථානට ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු අවුරුදු 35 ත් 45 ත් අතර වයසේ පසුවන අනන්‍යතාවය මෙතෙක් තහවුරුවී නොමැත.**

අනතුර සිදුවූ ස්ථානයේ තිබී මරණකරුගේ බවට සැකකරන පා පැදියක්ද තිබී ඇත. මෘත ශරීරය මැදවච්චිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මැදවච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**